# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2000/50 - 2017 ජනවාරි මස 04 වැනි බදාදා - 2017.01.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : කේඩීඑස්/කේජීකේ 4/2/2013/03/03.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/10/2014/UDA/43.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කරගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර සහ කඩවත් සතර හා ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟවට කෝරළේ සුළු කොට්ඨාසයේ, අංක 257 මහනුවර ග්‍රාම නිලධාරි වසමේ මහනුවර, කොට්ඨාස අංක 18 - කොටුගොඩැල්ල (මහනුවර මහ නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සවේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද 2016.10.27 දිනැති අංක මහ 6585 දරන මූලික පිඹුරෙහි කැබලි අංක 01 සිට 04 දක්වා වූ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0684ක් වූ පහත සඳහන් ඉඩම් කැබලි.

1. කැබලි අංක 01

ඉඩමේ නම: වරිපනම් අංක 33/1/1, 33/1/2, 33/1/3, 33/1/4, 35, 35/1, 35/2, 37, 39; ඉඩමේ විස්තරය: ගෙවත්ත, උළු සහ ඇස්බැස්ටස් සෙවිලි කළ දෙමහල් ස්ථිර ගොඩනැගිල්ල; හිමිකම් කියන්නා : රජය; මුල් හිමිකම් පාන්නා: අංක 35, දේව වීදියෙහි පදිංචි එල්. එන්. පානබොක්කේ; ප්‍රමාණය: හෙක්. 0.0165.

2. කැබලි අංක 02

ඉඩමේ නම: වරිපනම් අංක 21, 23/1, 23/1/1, 23/1/1ඒ, 23/1/2, 23/1/3, 23/1/4, 23/1/5, 23/1/6, 23/1/6ඒ, 23/1/6/සී, 23/1/6ඩී, 23/1/7, 23/2, 23/2ඒ, 25, 27, 29, 31; ඉඩමේ විස්තරය: ගෙවත්ත, උළු සහ ඇස්බැස්ටස් සෙවිලි කළ දෙමහල් ස්ථිර ගොඩනැගිල්ල; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: අංක 13/බී/14/1, හිල් පාර, හන්තාන නිවාස යෝජනා ක්‍රමයෙහි පදිංචි ජේ. එම්. එස්. පී. කේ. ජයසුන්දර, අංක 209, අස්වැද්දුම මැණික්දිවෙල පදිංචි ජේ. එම්. එස්. කේ. ජයසුන්දර, අංක 18, කුරුණෑගල පාර නුගවෙල හි පදිංචි ජේ. එම්. ජේ. මැණිකේ ජයසුන්දර සහ අංක 130, කැටවල, ලෙව්ල හි පදිංචි ජේ. ආර්. රත්නායක; ප්‍රමාණය: හෙක්. 0.0257.

3. කැබලි අංක 03

ඉඩමේ නම: වරිපනම් අංක 19, 19ඒ, 19බී, 19/1, 19/2, 19/3, 19/4, 19/1/1, 19/1/2, 19/1/3; ඉඩමේ විස්තරය: ගෙවත්ත, උළු සහ ඇස්බැස්ටස් සෙවිලි කළ දෙමහල් ස්ථිර ගොඩනැගිල්ල; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: අංක 24, රජපිහිල්ල මාවත හි පදිංචි එච්. ඒ. සී. වික්‍රමරත්න සහ අංක 496/8, පියාෂෝ උද්‍යානය මහනුවර හි පදිංචි ටී. බී. එච්. දුනුවිල; ප්‍රමාණය: හෙක්. 0.0198.

04. කැබලි අංක 04

ඉඩමේ නම: වරිපනම් අංක 17, 17/1, 17/2, 17/3, 17/1/1, 17/1/2 දේව වීදිය; ඉඩමේ විස්තරය: ගෙවත්ත, උළු සෙවිලි කළ දෙමහල් ස්ථිර ගොඩනැගිල්ල; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: අංක 496/8, පියාෂෝ උද්‍යානය මහනුවර හි පදිංචි ටී. බී. එච්. දුනුවිල; ප්‍රමාණය: හෙක්. 0.0064.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම්

හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 මාර්තු මස 29 වැනි දින ප.ව. 2.00ට මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2017 මාර්තු මස 22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

බී. එම්. පී. ජී. පී. වී. බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්,
මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ.

2016 නොවැම්බර් මස 30 වැනි දින,
මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01-560

---

ශුද්ධි පත්‍රිකාව

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

*යොමු අංකය* : 3/2/3/10/245 (iv).

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියට යටත්ව අංක 1817/4 හා 2013.07.01 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීමේ 17ඒ පිටුවේ සඳහන් මු.පි.ගම් 3892 කැබලි අංක 350න් කොටසක් අවසතු කිරීම සඳහා නැවත මැනීම් සිදුකර ඇති අතර, එහි කැබලි අංකය 453 ලෙස සංශෝධනය විය. එම සංශෝධනය නැවත අංක 1865/32 හා 2014.06.05 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීමේ 6ඒ පිටුවේ පළ විය. නැවත එම බිම් කොටස තුළ ද හිමිකරුවන් තිදෙනෙකු සිටින බැවින් වෙන වෙනම මැනීමේ දී කැබලි අංක 458, 459 සහ 460 වශයෙන් සංශෝධනය වී ඇත. ඒ අනුව කැබලි අංක 453 ට අදාළ ඡේදය පහත පරිදි සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

1. **කැබලි අංක 458**

ඉඩමේ නම: ෆැන්සි ෆීල්ඩ් එස්ටේට්; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් සහ තාවකාලික ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: මහනුවර පදිංචි දිනුක ශ්‍රී වර්ධන; ප්‍රමාණය: හෙක්. 0.1002 කි.

2. **කැබලි අංක 459**

ඉඩමේ නම: ෆැන්සි ෆීල්ඩ් එස්ටේට්; විස්තරය: වත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: කළගෙඩිහේන පිහිටි සෙරන්ඩිබ් හෝටිකල්චර් පුද්ගලික සමාගම; ප්‍රමාණය: හෙක්. 0.0033 කි.

3. **කැබලි අංක 460**

ඉඩමේ නම: ෆැන්සි ෆීල්ඩ් එස්ටේට්; විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: ලංකා දුම්කොළ සමාගම; ප්‍රමාණය: හෙක්. 0.0542 කි.

ඩී. එම්. රත්නායක,
ප්‍රාදේශීය ලේකම්,
අත්තනගල්ල.

2016 දෙසැම්බර් මස 05 වැනි දින,
අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01-562

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.